සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය 2021

| ජීව විද්‍යාව I | 09 S I | 13 ශ්‍රේණිය | පැය දෙකයි |
|---|---|---|---|

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

(01) පහත වගන්ති අතරින් සත්‍යවන්නේ කුමක්ද?
1. ස්වභාවික සම්පත් යනු එදිනෙදා ජීවිතයට හා ආර්ථික සංවර්ධනයට භාවිතා වන ස්වභාවිකව හමුවන ද්‍රව්‍ය වල ප්‍රභව පමණි.
2. ආගමන විගමන ගැටලු විසඳීමට DNA ඇඟිලි සලකුණු තාක්ෂණය භාවිතා වේ.
3. නිදන්ගත වකුගඩු රෝගීන් වාර්තාවන්නේ ශ්‍රී ලංකාවේ පමණි.
4. පෘථිවිය බිහිවූයේ මීට වසර බිලියන 3.5 කට පමණ පෙරය.
5. පෘථිවිය මත මුලින්ම ඇතිවූ ජීවීන් ස්වයංපෝෂී නිර්වායු ප්‍රාග්න්‍යෂ්ටිකයෝය

(02) ශාඛනය වූ පොලිසැකරයිඩ පමණක් අඩංගු වන්නේ,
1. ග්ලයිකොජන්, සෙලියුලෝස්, හෙමිසෙලියුලෝස්.
2. සෙලියුලෝස්, හෙමිසෙලියුලෝස්, ඇමයිලෝස්.
3. හෙමිසෙලියුලෝස්, ඇමයිලෝපෙක්ටින්, ග්ලයිකොජන්.
4. ඇමයිලෝස්, ග්ලයිකොජන්, සෙලියුලෝස්.
5. ඇමයිලොපෙක්ටින්, ඇමයිලෝස්, සෙලියුලෝස්.

(03) ක්ෂුද්‍ර නාලිකා දැකිය හැක්කේ,
A. සෛල සැකිල්ල B.පක්ෂ්ම හා කශිකාවල C කේන්ද්‍රිකා වල
1. A හා B වල පමණි 2. B හා C වල පමණි 3. A හා C වල පමණි
4. A, B හා C සියල්ලම 5. B වල පමණි

(04) සෝපාද්‍රව අර්බුදයක් පිළිබඳව සත්‍ය නොවන්නේ,
1. ස්ථානාන්තරනය පෙන්වයි.
2. ආක්‍රමණශීලීව අවයව එකකට හෝ කිහිපයකට පහරදෙයි.
3. ශල්‍යකර්මයක් මගින් සම්පූර්ණයෙන්ම ඉවත්කළ හැකිය.
4. ගුණනය වීමෙන් නව අර්බුදයක් සෑදිය හැක.
5. අවයව එකකට හෝ කිහිපයකට පහරදෙයි.

(05) එන්සයිම සම්බන්ධයෙන් පිළිගත හැකි ප්‍රකාශය වන්නේ,
1. සජීවී සෛල තුළදී පමණක් ක්‍රියාකාරී වේ.
2. උණුදිය උල්පත්වල සිටින බැක්ටීරියාවන්ගේ එන්සයිම ක්‍රියාකරන ප්‍රශස්ථ උෂ්නත්වය $50^0C$ පමණ වේ.
3. ATP ඇලොස්ටරික් නිශේධකයක් ලෙස ක්‍රියා කරමින් අපවෘත්තීය වේගය වැඩි කරයි.
4. ඇලොස්ටරික් යාමක බොහෝ එන්සයිම උප ඒකක දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් සෑදී ඇත.
5. ට්‍රිප්සින් සඳහා ප්‍රශස්ථ PH අගය 2 වේ.

(06) පොස්පොරලීකරණය පිළිබඳ නිවැරදි නොවන්නේ,
1. මයිකොකොන්ඩ්‍රියා මියරවල නැමීම ඔක්සිකාරක පොස්පොරයිලීකරණයට වැදගත් වේ.
2. NADH හා $FADH_2$ ඔක්සිකාරක පොස්පොරලීකරණයට භාජනය වේ.
3. TCA චක්‍රයේ දී උපස්ථර පොස්පෙරලීකරණයෙන් ATP නිපදවයි.
4. හරිතලවයේදී ඔක්සිකාරක පොසපෙරලීකරණය සිදුවේ.
5. ග්ලිකොලිසියේදී උපස්ථර පොස්පෙරලීකරණය සිදුවේ.

(07) කලාප කොපු සෛල තුල $O_2$ ඉතා අඩුවෙන් නිපදවීමට ප්‍රධාන හේතුව වන්නේ,
1. ප්‍රභා පද්ධති I අඩු වීම 2. ග්‍රැනා වලින් පොහොසත් වීම
3. PS II ප්‍රමාණය අඩුවීම. 4. PS I හා PS II ප්‍රමාණය අඩුවීම.
5. ග්‍රැනා විශාලවීම.

(08) හරිත ඇල්ගීවල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1. බීජාණුධානි මගින් නිපදවන බිත්ති සහිත බීජාණු.
2. බහු සෛලික ජන්මාණුධානි
3. පරාධීන කලලය
4. සෛල බිත්ති දැරීම
5. අග්‍රස්ථ විභජක

(09) අධිරාජධානි දෙකක පමණක් දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1. ප්‍රෝටීන් සංශ්ලේෂණයේ ආරම්භක ඇමයිනෝ අම්ලය ෆෝමයිල් මෙතියොනීන් වීම.
2. RNA පොලිමරේස් එක් ආකාරයක් පමණක් ඇත.
3. ප්‍රතිජීවක මගින් වර්ධනය නිශේධනය වේ.
4. බොහෝ ජානවල ඉන්ට්‍රෝන ඇත.
5. DNA සමඟ බැඳුණු හිස්ටෝන ප්‍රෝටීන පැවතීම.

(10) සංසෛලීය දිලීර සූත්‍රිකා දැකිය හැක්කේ,
1. *Mucor* හා *Penicillium*
2. *Aspergillus* හා *Chytridium*
3. *Chytridium* හා *Rhizopus*
4. *Agaricus* හා *Saccharomyces*
5. *Saccharomyces* හා *Penicillium*

(11) සංවෘත සංසරණ පද්ධතියක ක්ෂීණ වී හෘදයක් රහිත වී ඇති සත්ව වංශය වන්නේ,
1. නිඩාරියා
2. එකයිනෝඩර්මේටා
3. ඇනෙලිඩා
4. නෙමටෝඩා
5. ප්ලැටිහෙල්මිතස්.

(12) පරිචක්‍රය පිළිබඳව සත්‍ය වන්නේ,
1. මෘදුස්තර හෝ දෘඩ ස්තර වලින් සෑදී ඇත.
2. බාහිකයේ ඇතුලතම සෛල ස්තරය වේ.
3. සෛල ස්තර දෙකකින් හෝ තුනකින් සමන්විතය
4. විභාජනය වීමේ හැකියාව ඇත.
5. ශාක මූලෙහි පාර්ශ්වීත මුල් හටගැනීමට දායක වේ.

(13) පහත දැක්වෙන්නේ ශාක වංශයක සාමාජිකයන්ගේ දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයකි.
a. බීජ රහිත සම බීජාණුක වීම
b. බීජාණු ශාකය මත යැපෙන්නේ නැති ජන්මාණු ශාකයක් තිබීම.
c. සනාල පටක ඇත.
1. බ්‍රයෝෆයිටාවන්ටය.
2. ලයිකොෆයිටාවන්ටය.
3. ටෙරෝෆයිටාවන්ටය.
4. සයිකැඩොෆයිටාවන්ටය.
5. කොනිෆෙරොෆයිටාවන්ටය.

(14) ශාකවල උත්ස්වේදන ශීඝ්‍රතාව වැඩි වීමට අවම ලෙස බලපාන්නේ,
1. ආලෝකයේ තීව්‍රතාවය වැඩිවීම.
2. උෂ්ණත්වය වැඩිවීම
3. ආර්ද්‍රතාවය වැඩිවීම
4. සුළඟේ වේගය වැඩිවීම.
5. ප්‍රයෝජනයට ගත හැකි පාංශු ජල ප්‍රමාණය වැඩිවීම.

(15) නිල් ආලෝක ප්‍රභා ප්‍රතිග්‍රාහක මගින් ශාකවල සිදුවන ප්‍රතිචාර අයත් වරණය වන්නේ,
1. ප්‍රභාවර්තනය, පූටිකා විවරවීම, බීජ ප්‍රරෝහණය
2. ප්‍රභාවර්තනය, පූටිකා විවරවීම, බීජ පැලය පස් මතුපිටට පැමිණි විට බීජධරය දික්වීම නිශේධනය.
3. බීජ ප්‍රරෝහණය, සෙවන මගහැරීම, ප්‍රභාවර්තනය.
4. පූටිකා විවරවීම, ප්‍රභාවර්තනය, සෙවන මගහැරීම.
5. බීජ පැලය පස මතුපිටට පැමිණි විට බීජාධරය දික්වීම නිශේධනය, පූටිකා විවරවීම, සෙවන මගහැරීම.

(16) පහත දැක්වෙන්නේ ශාක මූලද්‍රව්‍ය වල ඌනතා ලක්ෂණ කිහිපයකි.
a. පර්වවල දිග අඩුවීම.
b. ළපටි පත්‍රවල හරිතක්ෂය.
c. පත්‍ර මායිම් කහ, දුඹුරුවීම.
ඉහත ලක්ෂණ පෙන්වන මූලද්‍රව්‍ය අනුපිළිවෙල වන්නේ,
1. S, Zn,Ca
2. K, Mg, N.
3. B, S, Fe.
4. Zn, S, K.
5. Ni, Mn, Cu .

(17) පරිවර්මය පිළිබඳව අසත්‍ය වන්නේ
1. වල්ක කැම්බියම හා එයින් නිපදවන පටක එක්ව ගත් කළ පරිවර්මය ලෙස හඳුන්වයි.
2. පරිවර්මය ජලයට හා වායු වලට පාරගම්‍ය වේ.
3. පරිවර්මයේ පිහිටි තිරස් පැළුම් වා සිදුරු ලෙස හඳුන්වයි..
4. පරිවර්මය පොත්තට අයත් ප්‍රධාන කොටසකි.
5. කලින් කලට පරිවර්මය ගැලවී ඉවත්වේ.

(18) ශාක වල ශීත ආතති වලදී,
1. ෆීනෝලික සංයෝග නිපදවයි.
2. ප්ලාස්ම පටලයේ සංතෘප්ත මේද අම්ල අනුපාතය වැඩි කරයි.
3. සමහර ශාක වල පත්‍ර පතනය සිදුකරයි.
4. සෛල වල ජල විභවය සාංඝ ද්‍රාවණයේ ජල විභවයට වඩා වැඩිකර තබා ගනී.
5. සෛල පටලයේ ඇති ලිපිඩ අනු ස්ඵටික ව්‍යුහයක් බවට පත්වෙමින් ද්‍රව්‍ය පරිවහනය අවහිර කරයි.

(19) සම්බන්ධක පටක සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. මේවා මගින් අවයව හා පටක ව්‍යුහමය ලෙස හා කෘත්‍යමය ලෙස සම්බන්ධ කරයි.
2. විශාල වූ බහිඃ සෛලීය පූරකයක තන්තු හා සෛල පවතී.
3. රුධිර පටකය විශේෂිත සම්බන්ධක පටකයක් ලෙස සැලකේ.
4. පටකයේ ඇති ප්‍රත්‍යාස්ථ තන්තු මගින් ප්‍රත්‍යස්ථ බවත් ජාලාකාර තන්තු මගින් ශක්තිය හා සුනම්‍යතාවය හා ඇති කරයි.
5. පූරකයේ ඇති කුඹ සෛල මගින් හෙපැරින් හා හිස්ටැමින් ස්‍රාවය කරයි.

(20) අග්න්‍යාශයික යුෂයේ අඩංගු එන්සයිමයක් නොවන්නේ පහත සඳහන් කවරක්ද?
1. ට්‍රිප්සින්. 2. කාබොක්සි පෙප්ටිඩේස් 3. ඇමයිනෝ පෙප්ටිඩේස්
4. කයිමෝ ට්‍රිප්සින් 5. නියක්ලියේස්

(21) මිනිසාගේ අම්ල - භෂ්ම සහ ජල සමතුලිතතාවත්, එන්සයිම සහ සාධක ලෙසත් ක්‍රියා කරන ඛනිජ අනුපිළිවෙල වනුයේ.
1. K,Cl හා , Mg, Fe ය 2. K ,Na හා Mg, Fe ය 3. K,Na, හා Mg, S ය
4. K,Cl හා Mg, Fe ය 5. K, p හා Fe, S ය.

(22) අධ්‍යාතතිය ඇතිවීමට හේතු සාධකයක් නොවන්නේ කුමක්ද?
1. අධික රුධිර වහනය 2. අධික ලුණු පරිභෝජනය 3. ආතතිය
4. අධික මධ්‍යසාර පරිභෝජනය 5. මධුමේහය.

(23) ස්වසන ව්‍යුහ නිවැරදිව කලපා ඇත්තේ කවරකද?
1. පත් පෙනහැලි - ගෝණුස්සෝ හා කුනිස්සෝ.
2. ස්වාස නාල පද්ධති - කෘමීන් හා මකුළුවන්
3. ජලක්ලෝම - කරදිය ඇනලීඩාවෝ හා පැතලි පණුවන්.
4. දේහ පෘෂ්ඨය - නිඩාරියා හා ගැඩවිල්ලු.
5. සම - උභයජීවීන් හා නිඩාරියා.

(24) අසාත්මිකතාව පිළිබඳ අසත්‍ය ප්‍රතිචාරය තෝරන්න.
1. සමහර පුද්ගලයින් තුල අධිසංවේදී ප්‍රතික්‍රියා ප්‍රේරණය කරන ප්‍රතිදේහජනක අසාත්මිකකාරක නම් වේ.
2. අසාත්මිකකාරකයන්ට එරෙහිව කුඹ සෛල ප්‍රේරණය වී හිස්ටැමින් ශ්‍රාවයවීම සිදුවේ.
3. අසාත්මික ප්‍රතික්‍රියා වලදී පෙනහැලි දක්වා වාතය ගෙනයන සිනිඳු පේශී සංකෝචනය කිරීමෙන් හුස්ම ගැනීමේ අපහසුතා ඇතිවේ.
4. පරාග, දූවිලි, ඇතැම් ආහාර පෙනිසිලින් වැනි ප්‍රතිජීවක අසාත්මික කාරක කිහිපයකි.
5. අසාත්මිකකාරක දේහයට ඇතුළුවූ විට ඊට එරෙහිව සයිටොටොක්සික් T සෛල හා ප්‍රතිදේහ නිපදවයි.

(25) මිනිස් කශේරුව පිළිබඳ සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. උරස් කශේරුකා - පර්ශු සඳහා සන්ධාන මූණත් කශේරුකා දේහයේ පමණක් ඇත.
2. ග්‍රෛවි කශේරුකා - තීර්යක් ප්‍රසර වල කශේරුකා ධමනි සඳහා සිද්‍ර පිහිටයි.
3. කටි කශේරුකා - කශේරුකා දේහය විශාල වන අතර කණ්ටක ප්‍රසර කුඩාය.
4. අක්ෂ කශේරුකා - හිස්කබල හා ඇට්ලස් කශේරුකාව දන්තාකාර ප්‍රසරය මත හිස ඉහළ පහළ වලනය කරවයි.
5. ත්‍රිකාස්ථිය - ත්‍රිකෝණාකාර හැඩැති වන අතර පූර්ව ප්‍රදේශය උත්තල වී ඇත.

(26) දෙවන ත්‍රෛමාසිකයේදී භ්‍රෑණයේ සිදුවන වෙනස්කමක් නොවන්නේ,
1. අවයව පද්ධති සම්පූර්ණයෙන්ම විකසනය වීම
2. භ්‍රෑණයේ චලනය මවට සංවේදනය වීම.
3. භ්‍රෑණයේ දිග 5-7cm පමණ වීම.
4. හෘත් ස්පන්දනය ආරම්භ වීම.
5. භ්‍රෑණයේ වේගවත් වර්ධනයක් සිදුවීම.

(27). මිනිස් ගහනයක නිලීන ලක්ෂණයන් 2500කට ඒකක සංඛ්‍යාවකින් පවතී නම් එම ගහනයේ එම ලක්ෂණය සඳහා විෂම යුග්මක පුද්ගලයන්ගේ ප්‍රතිශතය විය හැක්කේ,
1. 0.39%
2. 0.392%
3. 3.92%
4.9%
5. 39.2%

(28). ප්‍රෝටීන සංශ්ලේෂණයේ පරිවර්ථනය ආරම්භ කිරීමේ සංකීර්ණය තුළ පිහිටා ඇත්තේ,
1. රයිබොසෝමීය උප ඒකකය පමණි.
2. mRNA හා ආරම්භක tRNA පමණි.
3. Aug ආරම්භක හා හා රයිබොසෝමීය උප ඒකකය පමණි.
4. රයිබොසෝමීය උප ඒකකය mRNA හා ආරම්භක tRNA පමණි
5. Aug ආරම්භක ........ හා ආරම්භක tRNA පමණි.

(29). අපගාහාර්ථක විකෘතියක් යනු,
1. පොලිපෙප්ටයිඩයක එක් ඇමයිනෝ අම්ලයක් වෙනස් වීම.
2. නියුක්ලියෝටයිඩ යුගල් එකක් හෝ වැඩි ගණනක් එකතුවීම.
3. නියුක්ලියෝසෝටයිඩ යුගල් එකක් හෝ වැඩි ගණනක් ඉවත්වීම.
4. වර්ණදේහයක කොටසක් නැතිවීම.
5. සාමාන්‍ය වර්ණදේහ සංඛ්‍යාව වෙනස්වීම.

(30). එක්තරා බියෝමයක් පහත සඳහන් ලක්ෂණ පෙන්වයි.
- සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 300-500 mm වේ.
- ගිනිගැනීමකට පසුව පමණක් බීජ ප්‍රරෝහණය වේ.
- කුරු වනාන්තර හා පඳුරු වලින් ගැවසුණු ඒවා වන අතර ආකාෂ්යීය වෘක්ෂලතාදිය ඇත.

ඉහත සඳහන් බියෝමය විය හැක්කේ,
1. සෞම්‍ය කලාපීය පළල් පත්‍ර වනාන්තර
2. සෞම්‍ය කලාපීය තෘණ භූමි
3. චපරාල්
4. නිවර්තන වනාන්තර.
5. තුන්ද්‍රා

(31). ජෛව විවිධත්වයට මුහුණපා ඇති තර්ජනයක් නොවන්නේ,
1. වාසස්ථාන අහිමිවීම
2. කාන්තාරකරණය
3. අධි පරිභෝජනය.
4. ආක්‍රමණික ආගන්තුක විශේෂ හඳුන්වාදීම.
5. පරිසර දූෂණය.

(32). විශේෂ නෂ්ටවීම පිළිබඳව පහත සඳහන් කවර ප්‍රකාශයක් අසත්‍ය වේද?
1. නෂ්ටවීම යනු කිසියම් ජීව විශේෂයකට අයත් අවසාන සාමාජිකයාත් පෘතුවියෙන් ඉවත්වීමයි.
2. ස්වභාවික නෂ්ටවීම පරිණාමික ක්‍රියාවලියක කොටසකි.
3. *Crudia zeylanica* යනු නෂ්ටවූ රනිල ශාකයකි.
4. ඉදිරි වසර 30 තුල විශේෂ අතරින් 10-15 % පමණ නෂ්ට විය හැකි බව ඇස්තමේන්තු කර තිබේ.
5. මානව ගහනය වර්ධනයත් සමඟ මිනිසා විසින් නෂ්ටවීමේ සීඝ්‍රතාව වැඩිකර ඇත.

(33). ජෛව විවිධත්වයේ පාරිසරික සේවා වටිනාකමට නිදසුනක් වනුයේ පහත සඳහන් කවරක්ද?
1. ජාතික වනෝද්‍යාන පවත්වාගෙන යාම.
2. නව විද්‍යා තාක්ෂණික සොයාගැනීම් සඳහා භාවිතය.
3. පක්ෂීන් නැරඹීම, ඡායාරූප ශිල්පය සඳහා අවස්ථාව ලබා ගැනීම.
4. කාව්‍ය නිර්මාණ වැනි කලාත්මක කටයුතු සඳහා නිර්මාණාත්මක අදහස් ලබා ගැනීම.
5. වායුගෝලයේ තෙතමනය ප්‍රතිචක්‍රීකරණය මගින් දේශගුණය යාමනය කිරීම.

(34). රූමැටික උණ රෝගය ඇති කිරීමට හේතුවන ක්ෂුද්‍රජීවී විශේෂය වන්නේ,
1. *Haemophilus influenzae.*
2. *Streptococcus pyogenes.*
3. *Staphylococcus aureus*
4. *Leptospira interrogans.*
5. *Nisseria gonorrhoeae.*

(35). න්‍යෂ්ටික අම්ල රහිතව පැවැත්මට හා ගුණනයට හැකියාව ඇති ජීවී කාණ්ඩය වන්නේ,
1. ආකි බැක්ටීරියා.
2. වෛරස.
3. වෛරොයිඩ
4. ප්‍රියෝන.
5. ඇක්ටිනෝමයිසිටිස්.

(36). බොහෝවිට බූස්ටර ප්‍රතිශක්තිකරණයක් අවශ්‍ය නොවන්නේ,
1. රේබිස් එන්නත.
2. MMR එන්නත.
3. හෙපටයිටිස් B එන්නත
4. පෝලියෝ එන්නත.
5. ඉන්ෆ්ලුවැන්සාවට ලබාදෙන එන්නත්.

(37). ක්ෂුද්‍රජීවීන් අධ්‍යනය හා සම්බන්ධ පද කිහිපයක් හා ඒවායේ අදහස පහත දැක්වේ.
a) අපූති ශිල්ප ක්‍රම - රෝපණ මාධ්‍ය හා භාවිතා කරන උපකරණ ජීවාණුහරිත තත්වයෙන් භාවිතය.
b) ආමුකුලනය - රෝපණ මාධ්‍යට ක්ෂුද්‍ර ජීවීන් ඇතුල් කිරීම.
c) ලේබණය - රෝපණ මාධ්‍ය සහිත ප්‍රෙට්‍රීදිසි (ලේබල්) නම් කිරීම
ඉහත සංකලන අතරින් නිවැරදි සංකලන හෝ සංකලනය වන්නේ.
1. a පමණි.
2. b පමණි.
3. c පමණි.
4. a හා b පමණි.
5. b හා c පමණි.

(38). ස්වායු තත්වය යටතේ සිදුවන ක්‍රියාවලියක් නොවන්නේ,
1. සාන්ද්‍ර පෙරනයක සිදුවන ද්විතික පිරියම්කරණය.
2. රොන්බොර ජීරකයක ජීව වායුව නිපදවීම.
3. පාංශු ක්ෂුද්‍රජීවීනගේ නයිට්‍රීකරණය.
4. කොම්පෝස්ට් සෑදීම.
5. ඇසිටික් අම්ල පැසීමේ ක්‍රියාවලිය.

(39). අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. කාර්මික අපජලය පිරිපහදු පිරියතක සක්‍රිය බොර පද්ධතිය ජෛව ඔක්සිජන් ඉල්ලුම අඩු කිරීමට වැදගත් වේ.
2. කොලිෆෝම් පරීක්ෂාව මගින් පානීය ජලයේ ක්ෂුද්‍ර ජීවීන් නැති බව තහවුරු කෙරේ.
3. අපජල පිරිපහදුවේදී ප්‍රාථමික හා ද්විතික පිරියම් ක්‍රියාවලි දෙකේදීම රොන් බොර ඉවත්කරයි.
4. කෝලිෆෝම් බැක්ටීරියා ග්‍රෑම් සෘණ හා දණ්ඩාකාර හැඩතිය.
5. ලෙප්ටොස්පයිරෝසියා වාහකයන්ගේ ගුණනයට සන අපද්‍රව්‍ය දායක වේ.

(40). ශ්‍රී ලංකාවේ මිරිදිය විසිතුරු මත්ස්‍ය විශේෂ වලට බැක්ටීරියා බාණ්ඩයක් හේතුවෙන් සුලභව වැලදෙන රෝග අයත් ප්‍රතිචාරය වන්නේ,
1. ට්‍රයිකොඩිනෝසිස්, ඉච් රෝගය.
2. කොලම්නාරිස්, කරමල් හා වර්ම ප්‍රදාහය.
3. රක්තපාත සෙප්ටිසීමියා, කොලම්නාරිස්.
4. ඉච් රෝගය, රක්තපාත සෙප්ටිසීමියා.
5. ට්‍රයිකොඩිනෝසිස්, කරමල් හා වර්ම ප්‍රදායහය.

41 – 50 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත වගුව යොදාගන්න

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| A,B,D නිවැරදිය | A,C,D නිවැරදිය | A,B නිවැරදිය | C,D නිවැරදිය | වෙනත් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචා කිහිපයක් නිවැරදිය |

(41). ජීවදේහ තුල අන්තර්ගත සංයෝග පිළිබඳව සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ,
A. සමහර සංචිත පොලිසැකරයිඩ ඇල්ඩෝස බාණ්ඩයට අයත් මොනොසැකරයිඩ බහු අවයවීකරණයෙන් සෑදී ඇත.
B. පෘෂ්ඨවංශීන්ගේ ස්වසන වර්ණක සියල්ල චාතුර්ථ ව්‍යුහය දරණ ප්‍රෝටීන වේ.
C. ට්‍රයිග්ලිසරයිඩවල ද්විත්ව බන්ධන තිබිය හැක.
D. ප්‍රෝටීන වල ද්විතියික ව්‍යුහයේ H බන්ධන සෑදීමට O පමාණු, N පරමාණු හා H පරමාණු දායක වේ.
E. පොලිපෙප්ටයිඩ දාම 2ක් දඟර ගැසීමෙන් හා නැවීමෙන් මකුළුවාගේ සිල්ක් තන්තු සාදයි.

(42). ජෛව විවිධත්වයේ පරිණාමය සම්බන්ධයෙන් පිලිගත හැක්කේ,
A. ප්‍රථම ඉයුකැරියෝටා පොසිල වසර බිලියන 3.5ක් පමණ පැරණි බව.
B. ස්පොන්ජින් පරිණාමය වී ඇත්තේ වසර මිලියන 670 කට පමණ පෙරදී බව.
C. ප්‍රථම ප්‍රභාසංස්ලේෂන ජීවීන්ගේ පොසිල වසර බිලියන 2.7 කට පෙර බිහිවූ බව.
D. පැරණිම ප්‍රොසිස්ටාවන්ගේ පොසිල වසර බිලියන 1.2ක් පමණ පැරණි බව.
E. දැනට වසර මිලියන 265කට පෙර මුල්ම සිව්පාවන් පරිණාමය වූ බව.

(43). සමස්ථිතියේදී වෘක්ක වල කාර්යභාරය වනුයේ පහත සඳහන් කුමන ඒවාද?
A. රුධිර පරිමාව හා පීඩනය පාලනය.
B. එරිත්‍රොපොයෙටින් හෝමෝනය ශ්‍රාවය.
C. දේහයේ විෂ ද්‍රව්‍ය වල විෂ හරණය.
D. ආශ්‍රැති විධානය හා අම්ල- භෂ්ම තුල්‍යතාවය පවත්වා ගැනීම.
E. මේද පරිවෘත්තිය

(44). ගර්භණීභාවය හා සම්බන්ධ හෝමෝන ආශ්‍රිතව අසත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ වනුයේ කුමක්ද?
A. කිරි සංස්ලේෂණය හා ශ්‍රාවය වීමේ ප්‍රධානතම හෝමෝනය ප්‍රොලැක්ටින්ය.
B. ඊස්ට්‍රඩියෝල් හා ඔක්සිටොසින් මගින් ගර්භාෂය තව දුරටත් සංකෝචනය වීම උත්තේජනය කර යාමනය කරයි.
C. උපතින් පසු මවගේ රුධිරයේ ඊස්ට්‍රඩියෝල් මට්ටම ඉහල යන අතර ප්‍රොජෙස්ටරෝන් මට්ටම පහළ යයි.
D. හයිපොතැලමසය මගින් පූර්ව පිටියුටරිය වෙත ආවේග යැවීමෙන් පොලැක්ටින් හා ඔක්සිටොසින් හෝමෝන ශ්‍රාවයෙන් ස්ථන ග්‍රන්ථි වලින් කිරි නිපදවීම හා විසර්ජනය සිදුවේ.
E. කලලය මගින් ශ්‍රාවය වන hCG හෝමෝනයෙන් ඩිම්බකෝෂයේ පීත දේහය පවත්වාගනී.

(45). උපාගම හරහා ස්නායු ආවේග සම්ප්‍රේශණය වීමේදී සිදුවන්නේ පහත සඳහන් කවර ක්‍රියාද?
A. ස්නායු සම්ප්‍රේෂක එන්සයිමීය ජල විච්ඡේදනය.
B. ස්නායු සම්ප්‍රේෂක උපාගම පැල්ම තුලට නිදහස් වීම.
C. $Ca^{2+}$. පූර්ව උපාගම පර්යන්තයේ සිට පිටතට විසරණය වීම.
D. ස්නායු සම්ප්‍රේෂක පූර්ව උපාගම් පටලයේ විශිෂ්ට ප්‍රතිග්‍රාහක වලට බැඳීම.
E. පූර්ව උපාගම පර්යන්ත තුලට ස්නායු සම්ප්‍රේෂක නැවත ප්‍රතිග්‍රහණය.

(46). සත්ව රාජධානිය තුල දැකිය හැකි ස්වසන වර්ණක පිළිබඳ නිවැරදි ගැලපීම තෝරන්න.
A. හිමොඑරිත්‍රින් - සමහර ඇනලිඩාවන්.
B. ක්ලොරොකෲවරින් - බොහොමයක් මොලුස්කාවන්.
C. හිමොසයනින් - ආත්‍රපෝඩා හා මොල්ස්කා.
D. හිමොග්ලොබින් - මිනිසා හා ඇනලිඩා.
E. මයොග්ලොබින් - එකයිනොඩර්මෙටා හා සාගර පෘෂ්ඨවංශීන්.

(47). ජීවීන්ගේ අභිජනන ක්‍රම පිළිබඳව සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ තෝරන්න.
A. බහුගුණකතාවය යනු සෑම සෛලීය න්‍යෂ්ටියකම සමස්ත සමජාන වර්ණදේහ කට්ටල යුගලකට වඩා දක්නට ලැබීමයි.
B. ප්‍රේරිත විකෘතිකරණය පරපරාගණයේදීට වඩා ස්වපරාගනයේදී සාරථක වේ.
C. බහු ගුණකතාවය හා සබැදි ලක්ෂණයක් වන්නේ සමයුග්මකතාව වැඩිවීමයි.
D. ප්‍රේරිත විකෘතිකරණය අලිංගිකව ප්‍රචාරණය වන භෝග ශාක වල වැඩිදියුණුකම් සිදු කිරීමට යොදාගත නොහැක.
E. බහුගුණ ශාක ඒවායේ ද්විගුණකයන්ට සාපේක්ෂව වැඩි වර්ධන වේගයක් පෙන්වයි.

(48). DNA ක්ලෝනකරණය සඳහා වාහක ලෙස භාවිතා කල හැක්කේ,
A. බැක්ටීරියා භක්ෂක DNA
B. යීස්ට් කෘතිම වර්ණදේහ. (YAC)
C. ශාක වෛරස.
D. බැක්ටීරියා ප්ලාස්මිඩ.
E. වෛරෝයිඩ වල න්‍යෂ්ටික අම්ල.

(49). ප්‍රෝටීනමය ආහාරයක් නරක් වීමේදී සෑදිය නොහැකි ඵල වන්නේ,
A. ඇමයිනෝ අම්ල
B. ඇමීන
C. $CO_2$
D. අම්ල
E. $H_2S$

(50). ක්ෂුද්‍ර ජීවී රෝග පාලනය සඳහා යොදාගන්නා ප්‍රතිජීවක හා එහි ක්‍රියාකාරීත්වය අතර ගැලපෙන සබඳතාව නිරූපණය කර ඇත්තේ,
A. පෙනිසිලින් - සෛල බිත්ති සංස්ලේෂණය නිශේධනය.
B. ඩැප්ටොමයිසීන් - ප්ලාස්ම පටලය කඩා බිඳ දැමීම.
C. ටෙට්‍රාසයික්ලින් - RNA සංස්ලේෂණය නිශේධනය.
D. රිෆැම්පින් - සෛල පටල වල පාරගම්‍යතාව නිශේධනය.
E. එරිත්‍රොමයිසීන් - ප්‍රෝටීන සංස්ලේෂණය නිශේධනය.

****